ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No .

දිනය / திகதி / Date. 2024.10.15

ආර්.එම්.ප්‍රදීප් රුවන් චින්තක රණසිංහ
අංක 42, කිරිමැටියාව
මහව

**පැමිණිලිකාර පාර්ශවය**

01. ආර්.එම්.ජයන්ත රාජපක්ෂ
ප්‍රධාන පොලිස් පරික්ෂක
මූලස්ථාන පොලීසිය
මහව

02. එච්.එම්.කේ.ඉන්දික හේරත්
උප පොලිස් පරික්ෂක
මූලස්ථාන පොලීසිය
මහව

03. එස්.එම්.තිස්ස බණ්ඩාර
පොලිස් සැරයන් 34119
මූලස්ථාන පොලීසිය
මහව

04. එම්.පී.ලංකාතිලක ජයවර්ධන
පොලිස් සැරයන් 34462
මූලස්ථාන පොලීසිය
මහව

**වගඋත්තරකාර පාර්ශවය**

**පැමිණිලි අංකය : HRC/ANU/05/2022(S)**

**පැමිණිලිකාර පාර්ශවයේ කරුණු දැක්වීම**

පැමිණිලිකරු විසින් 2022.01.04 දිනැති පැමිණිල්ල මගින් ප්‍රකාශ කර සිටින්නේ, 2021.12.27 වන දින තම මව සමඟ මහව නගරයට යමින් සිටියදී සිවිල් ඇඳුමින් සැරසුනු පොලිස් නිලධාරීන් දෙදෙනෙකු පැමිණ තම ත්‍රීරෝද රථය නතර කර ත්‍රීරෝද රථය මහව පොලිස් ස්ථානය තුළට දමන ලෙසට තර්ජනය කළ බවත්, පසුව තම මව ත්‍රීරෝද රථය තුළ සිටියදී තමාව අතින් ඇදගෙන ගොස්



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්. ඒ. ද. මෙල් මාවත කොළඹ -04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04. / No. 14, R.A.De Mel Mawatha, Colombo -04.
සභාපති / தவிசாளர் / Chairman: 011- 2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011- 2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 /82
ලේකම් / செயலாளர் / Secretary: 011- 2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

මහව පොලිස් ස්ථානයේ තිබූ කාමරයකට දමා, තම අතට මාංචු දමා, බිම හිඳුවා, යාපහුව ප්‍රදේශයේ ගිනිගත් මෝටර් රථයක් තමා ගිනි තැබූ බවට වරද භාර ගන්නා ලෙසට තමාට පැවසූ බවයි. එහෙත් තමා එකී වරද භාරගැනීම ප්‍රතික්ෂේප කළ බැවින් අඟල් 1 ½ ක පමණ හෝස් එකකින් තමාහට පො. සැ. 34199 එස්.එම්. තිස්ස බණ්ඩාර නිලධාරියා විසින් පහරදුන් බවත්, උ.පො.ප. එච්.එම්.කේ. ඉන්දික හේරත් නිලධාරියා ද තමාට පහරදුන් බවත්, තමා වරද භාර නොගන්නා බැවින් වරද භාර ගන්නාතුරුම පහරදෙන බව පැවසූ බවත් පැමිණිලිකරු විසින් ප්‍රකාශ කර ඇත.

එසේම, තමාට පහරදෙන ශබ්දය ඇසී තම මව එම ස්ථානයට පැමිණ ඇති බවත්, එවිට තම මව පිටතට යවා ඇති බවත්, අනතුරුව නැවතත් තමාට පහරදීමට පටන් ගත් බවත් පැමිණිලිකරු විසින් ප්‍රකාශ කර ඇත. කොතරම් පහරදීම් සිදු කළ ද තමා වරද භාර නොගත් බැවින් තවත් වරදවල්වලට හසුකර හිරේ දමන බවට තර්ජනය කළ බවත්, පසුව එදිනම තමා මහව පොලිස් ස්ථානයේ සිර මැදිරියකට දමන ලද බවත් පැමිණිලිකරු විසින් වැඩිදුරටත් දක්වා ඇත.

තවද, අත්අඩංගුවට ගත් දිනට පසුදින එනම්, 2021.12.28 වන දින පැමිණිලිකරු අධිකරණය වෙත රැගෙන යාමට පෙර මහව රෝහල වෙත රැගෙන ගිය බවත්, වෛද්‍යවරයා විසින් අමාරු තියනවාද, තුවාල තියනවාද යනුවෙන් ඇසූ බවත්, එම තුවාල පෙන්වීමට උත්සාහ කළ විට තමාව රෝහලට රැගෙන ගිය නිලධාරියා විසින් ඒවා පිළිබඳව නොකියන ලෙසට පවසා තම අත තදින් මිරිකාගෙන සිටි බැවින් තමා හට සිදු කළ පහරදීම් සම්බන්ධයෙන් වෛද්‍යවරයා වෙත දැනුම්දීමට ඉඩක් නොලැබුණු බවත් පැමිණිලිකරු විසින් ප්‍රකාශ කර ඇත. ඉන් අනතුරුව 2021.12.28 වන දින අධිකරණය වෙත ඉදිරිපත් කළ බව පැමිණිලිකරු විසින් සඳහන් කර ඇත. පැමිණිලිකරු කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටින්නේ, තමාට සිදුකල අසාධාරණය සම්බන්ධයෙන් සාධාරණ විමර්ශනයක් සිදුකර සහනයක් සලසා දෙන ලෙසයි.

<u>වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම</u>

මහව මූලස්ථාන පොලිස් ස්ථානයේ ප්‍රධාන පොලිස් පරික්ෂක සංජීව බණ්ඩාරනායක මහතා විසින් 2022.01.06 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත වාර්තාවක් යොමු කරමින් දන්වා සිටින්නේ, 2021.04.27 වන දින උපුල් ජයවර්ධන, රජිතපුර, දිවුල්ලැව, මහව යන අයගේ අංක එන්. ඩබ්.සී.බී.ඩී. 4526 දරණ කාර් රථයට ගිනි තබා අනර්ථයක් සිදුකිරීම සම්බන්ධයෙන් ලද පැමිණිල්ලකට අනුව සිදුකල විමර්ශනයේදී මෙම පැමිණිලිකරු විසින් අදාල කාර් රථයට ගිනි තබන ලද බවට සාර්ථක තොරතුරක් ලද බවත්, එම තොරතුර මත වැඩිදුර විමර්ශන සඳහා පැමිණිලිකරු අත්අඩංගුවට ගෙන ඇති බවත් ය. තවද, පැමිණිලිකරු 2021.12.28 වන දින පැය 10.20ට බී 30084/21 යටතේ මහව මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කළ බවත්, එදිනම ඇප මත මුදාහල බවත් එකී වාර්තාව තුළින් දක්වා ඇත.

**1 වන වගඋත්තරකරු වන ප්‍ර. පො. ප. ජයන්ත රාජපක්ෂ**

1 වන වගඋත්තරකරු වන ප්‍ර. පො. ප. ජයන්ත රාජපක්ෂ මහතා විසින් 2022.11.25 වන දින කොමිෂන් සභාව හමුවේ පැවති පරීක්ෂණයේදී ප්‍රකාශ කර ඇත්තේ 2021.04.27 වන දින කාර් රථයකට ගිනි තැබීමක් සම්බන්ධයෙන් වන පැමිණිල්ලක් මහව පොලිස් ස්ථානය වෙත ලද බවත්, එම පැමිණිල්ල සම්බන්ධ විමර්ශනය ආරම්භ කරන ලද බවත්, එම විමර්ශනයේදී පුද්ගලික තොරතුරුකරුවන්ගෙන් තොරතුරු ලද බවත්, එලෙස පුද්ගලික තොරතුරුකරුවෙකුගෙන් ලබාගත් තොරතුරු මත විමර්ශන කටයුතු සිදු කිරීම සඳහා මෙම පැමිණිලිකරු තමා විසින් අත්අඩංගුවට ගනු ලැබූ බවත් ය.

එමෙන්ම, තමා සමග මෙම පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීම සඳහා උ. පො. ප. ඉන්දික, පො. සැ. තිස්ස බණ්ඩාර, පො.සැ. 34462 ලංකාතිලක යන නිලධාරීන් ද සහභාගී වූ බවත් ප්‍රකාශ කර ඇත.

**2 වන වගඋත්තරකරු වන උ.පො.ප. එච්.එම්.කේ.ඉන්දික හේරත්, 3 වන වගඋත්තරකරු වන පො. සැ. 34119, එස්.එම්.තිස්ස බණ්ඩාර සහ 4 වන වගඋත්තරකරු වන පො. සැ. 34462 එම්.පී. ලංකාතිලක ජයවර්ධන**

මෙම වගඋත්තරකරුවන් ප්‍රකාශ කර සිටින්නේ, මෙම පැමිණිලිකරු අත්අඩංගුවට ගැනිමට අදාල වැටලීම් භාරව කටයුතු කරන ලද්දේ ප්‍රධාන පොලිස් පරික්ෂක ජයන්ත මහතා වන බවයි. වගඋත්තරකරුවන් තවදුරටත් ප්‍රකාශ කර සිටින්නේ, පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීම සඳහා ඔහුගේ නමින් පැමිණිල්ලක් නොතිබූ බවයි. පොලිස් ස්ථානය වෙත ලද පැමිණිල්ලක් මත විමර්ශනයක් ආරම්භ කළ බවත්, එකී විමර්ශනයේදී ලද විශ්වසනීය තොරතුරු මත පදනම්ව සාධාරණ සැකය මත මෙම පැමිණිලිකරු ප්‍රධාන පොලිස් පරික්ෂක ජයන්ත මහතා විසින් අත්අඩංගුවට ගත් බවත් 2,3 සහ 4 වන වගඋත්තරකරුවන් විසින් ප්‍රකාශ කර ඇත.

පැමිණිලිකරු විසින් 2 වන වගඋත්තරකරු වන උප පොලිස් පරික්ෂක එච්.එම්.ඒ.ඉන්දික හේරත් සහ 3 වන වගඋත්තරකරු වන පොලිස් සැරයන් 34119 තිස්ස බණ්ඩාර යන නිලධාරීන් තමන් හට පහරදිම් සිදු කළ බවට කරනු ලබන චෝදනා ප්‍රතික්ෂේප කරන බවත්, පැමිණිලිකරුට කිසිදු පහරදීමක් සිදුකර නොමැති බවත් 2 වන වගඋත්තරකරු වන උප පොලිස් පරික්ෂක එච්.එම්.ඒ.ඉන්දික හේරත් සහ 3 වන වගඋත්තරකරු වන පොලිස් සැරයන් 34119 තිස්ස බණ්ඩාර යන නිලධාරීන් විසින් සඳහන් කර ඇත.

## නිරීක්ෂණ

2021.04.27 වන දින මහව මූලස්ථාන පොලිස් ස්ථානයේ බල අපරාධ තොරතුරු සටහන් පොතේ පිටුව 258 සහ ඡේදය 240 යටතේ කාර් රථයකට ගිනි තැබීමක් සම්බන්ධව පැමිණිල්ලක් සටහන්ව ඇති බවත්, මෙකී පැමිණිල්ල අනුව 1 වන වගඋත්තරකරු වන ප්‍ර. පො. ප. ජයන්ත රාජපක්ෂ මහතා විසින් 2021.12.27 වන දින බල අපරාධ තොරතුරු සටහන් පොතේ පිටුව 98 ඡේදය 276 හි සටහන් යොදා අපරාධ විමර්ශන කටයුතු සඳහා පිටව ගොස් ඇති බවත් නිරීක්ෂණය වේ.

තොරතුරුකරුවෙකුගෙන් ලබා ගත් තොරතුරු අනුව වගඋත්තරකරුවන් විසින් එදිනම එනම්, 2021.12.27 වන දිනම තවදුරටත් විමර්ශනය කර ඇති අතර, එම විමර්ශනයේදී පැමිණිලිකාර ප්‍රදීප් රුවන් චින්තක රණසිංහ යන අය අදාළ අපරාධය සිදුකළ බවට අනාවරණය වූ බවටත්, ඒ අනුව මහව නගරයේ සංචාරය කරමින් සිටියදී 2021.12.27 වන දින පැය 12.15ට අංක NW QV 7882 දරණ ත්‍රිරෝද රථයේ පැමිණිලිකරු සිටියදී, 2021.04.27 දින හෝ ඊට ආසන්න දිනයකදී අංක NW CBD 4526 දරණ කාර් රථයට ගිනි තබා ඉඩමට අයුතු ඇතුළුවීමට අදාල වරද කියාදී පැමිණිලිකරු අත්අඩංගුවට ගත් බවටත් 1 වන වගඋත්තරකරු විසින් මහව මූලස්ථාන පොලිස් ස්ථානයේ බල අපරාධ තොරතුරු සටහන් පොතේ පිටුව 100 සහ ඡේදය 280 යටතේ සටහන් යොදා ඇති බව නිරීක්ෂණය වේ.

තවද, 1 වන වගඋත්තරකරු විසින් ඉහත කී සටහනෙහි වැඩිදුරටත් සඳහන් කර ඇත්තේ, අදාල බල අපරාධය සම්බන්ධයෙන් සිදුකරන ලද විමර්ශනයේදී ගිනි ගැනීමට ලක්ව තිබූ කාර් රථය පෙර පරිහරණය කරන ලද පුද්ගලයා වන මෙම පැමිණිලිකරු 2021.04.27 වන දිනට ආසන්න දිනයක සවස 6.30ත් 7.00ත් අතර කාලයේදි එම කාර් රථය තබා තිබූ නිවස ආසන්නයට යතුරු පැදියෙන් පැමිණ අදාල අපරාධය සිදුකල බවට තොරතුරු ලැබුණු බැවින් අදාල යතුරුපැදිය පිළිබඳව කරුණු විමර්ශනය කළ බවත්, එහිදී මෙම අපරාධයට මෙම පැමිණිලිකරු සම්බන්ධ බවට තොරතුරු අනාවරණය වූ බවත් ය. මෙම පැමිණිලිකරු යතුරුපැදියෙන් පැමිණ ඔහුගේ සාක්කුවෙන් යම් බෝතලයක් දමාගෙන ඉඩම වටා ඉදිකර ඇති යකඩ බාර් සහිත තාප්පයෙන් පැන්න බවට සාර්ථක තොරතුරක් 1 වන වගඋත්තරකරු වෙත ලැබුණු බවට 1 වන වගඋත්තරකරු විසින් ඉහත කී සටහනෙහි දක්වා ඇත.

ඒ අනුව 2021.12.27 දින පැය 12.15ට පැමිණිලිකරු මහව මූලස්ථාන පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් මහව නගරයේදී අත්අඩංගුවට ගෙන ඇති බවත්, අත්අඩංගුවට ගත් දිනට පසුදින එනම්, 2021.12.28 වන දින නඩු අංක බි 30084/21 යටතේ මහව මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කර ඇති බවත්, එදිනම ගරු අධිකරණය මගින් පැමිණිලිකරු ඇප මත මුදාහැර ඇති බවත් කොමිෂන් සභාවට පෙනී යයි.

1 වන වගඋත්තරකරු වන ප්‍ර. පො. ප. ජයන්ත රාජපක්ෂ මහතා විසින් මහව මූලස්ථාන පොලිස් ස්ථානයේ බල අපරාධ තොරතුරු සටහන් පොතේ යොදන ලද සටහන් අනුව මෙම පැමිණිලිකරු මෙම අපරාධය සිදුකල බවට එක් පුද්ගලයෙකු විසින් තොරතුරක් ලබා දී ඇති බව නිරීක්ෂණය වන අතර, එම තොරතුර විශ්වාස කටයුතු තොරතුරක් බවට නිගමනය කර පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීම සිදුකර ඇති බව පෙනී යයි.

එසේම, 1 වන වගඋත්තරකරු වන ප්‍ර. පො. ප. ජයන්ත රාජපක්ෂ මහතා වෙත ලැබී ඇති තොරතුරෙහි විශ්වසනීය බව පිළිබඳව තහවුරු කර ගැනිම සඳහා තවදුරටත් විමර්ශන සිදුකර ඇති බවට 1 වන වගඋත්තරකරු විසින් ප්‍රකාශ කළ ද, එලෙස සිදු කරන ලද විමර්ශනයකදී අනාවරණය වූ කරුණු සම්බන්ධයෙන් කිසිදු සටහනක් යොදා නොමැති බව නිරීක්ෂණය වන අතර, ඔහු වෙත ලැබී ඇති එකම තොරතුර මත පදනම්ව මෙම පැමිණිලිකරු අත්අඩංගුවට ගෙන ඇති බව ද පෙනී යයි.

1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහය පනතෙහි 32(ආ) වගන්තිය යටතේ යම් තැනැත්තෙකුට විරුද්ධව විශ්වාස කටයුතු තොරතුරු ලැබී තිබෙන අවස්ථාවකදී වරෙන්තුවක් නොමැතිව සාම නිලධරයන් විසින් සිර භාරයට ගත හැකි බව පෙන්වා දී තිබේ.

වගඋත්තරකරුවන් විසින් ඉදිරිපත් කර ඇති ප්‍රකාශ හා පොලිස් ස්ථානයේ තොරතුරු පොත් සටහන් අනුව පැමිණිලිකරු සම්බන්ධයෙන් වගඋත්තරකරුවන් වෙත ලැබී ඇති තොරතුර පිළිබඳව කරුණු සලකා බැලීමේදී වගඋත්තරකරුවන් විසින් අදාල තොරතුරු පිළිබඳව සාධාරණ විමර්ශනයක් සිදුකර තොරතුරේ විශ්වසනීයභාවය පිළිබඳව තහවුරු කරගෙන නොමැති බව නිරීක්ෂණය වේ. ඒ අනුව වගඋත්තරකාර පාර්ශවය විසින් පැමිණිලිකරු සම්බන්ධයෙන් ලැබී ඇති තොරතුරෙහි විශ්වසනීයභාවය තහවුරු කරනොගෙන පැමිණිලිකරුව අත්අඩංගුවට ගෙන ඇති බව පෙනී යයි.

පැමිණිලිකරු තම පැමිණිල්ල මගින් ප්‍රකාශ කර සිටින්නේ, තමාව අත්අඩංගුවට ගැනීමෙන් පසුව තමාට 2 වන වගඋත්තරකරු වන උ. පො. ප. එච්.එම්.කේ. ඉන්දික හේරත් සහ 3 වන වගඋත්තරකරු වන පො.සැ. 34119 තිස්ස බණ්ඩාර යන පොලිස් නිලධාරීන් දෙදෙනා විසින් පහරදුන් බවයි. 2වන වගඋත්තරකරු වන උ. පො. ප. එච්.එම්.කේ. ඉන්දික හේරත් මහතා විසින් තමා හට පයින් එක පහරක් ගැසූ බවත්, එවිට තමා බිම වැටුනු බවත්, 3 වන වගඋත්තරකරු වන පො.සැ. 34119 තිස්ස බණ්ඩාර මහතා විසින් තමාව කාමරයකට රැගෙන ගොස් පුටුවක වාඩි කරවා අත්වලට මාංචු දමා හෝස් බටයකින් මුළු ශරීරයකට පහරදුන් බවත් පැමිණිලිකරු විසින් ප්‍රකාශ කර ඇත.

එසේ හෙයින් මෙම පැමිණිලිකරුගේ අධිකරණ වෛද්‍ය වාර්තාව මහව රෝහල වෙතින් කැඳවා ඇති අතර, එම වෛද්‍ය වාර්තාව මගින් පහත තොරතුරු අනාවරණය කර ඇත.

පැමිණිලිකරු 2021.12.29 වන දින ප.ව. 7.10ට පමණ රෝහල්ගතව ඇත. රෝගියාගේ කෙටි ඉතිහාසය අනුව පොලිස් ස්ථානය තුල දී පොලිස් නිලධාරියෙකු විසින් රබර් හෝස් එකකින් හා පයින් පහරදුන් බවත්, ඔහුගේ පපුවේ පිටුපසට ඔළුව පිටුපසට හා මුහුණට පහරදුන් බවත් සටහන් කර ඇත.

එමෙන්ම, පැමිණිලිකරුගේ ශරීරයේ පැවති තුවාල පහත පරිදි සටහන් කර ඇත.

(i).Abrasion – Graze, 3cm on R/S Back of the shoulder.
Graze, 1cm Back of the R/Chest

(ii).Contusion – Back of the Chest 4-5cm
04 Contusions.

මෙම තුවාල බරපතල නොවන තුවාල ලෙසත්, මොට ආයුධයකින් ඇති විය හැකි තුවාල ලෙසත් අධිකරණ වෛද්‍ය වාර්තාව තුළ දක්වා ඇති බවට නිරීක්ෂණය වේ.

පැමිණිලිකරුව 2021.12.27 වන දින පැය 12.15ට අත්අඩංගුවට ගෙන 2021.12.28 වන දින පැය 10.20 අධිකරණය වෙත ඉදිරිපත් කර ඇති බවට කරුණු නිරීක්ෂණය වන අතර, පැමිණිලිකරු 2021.12.29 වන දින රෝහල්ගතව ඇති බව ද නිරීක්ෂණය වේ.

පැමිණිලිකරුගේ පැමිණිල්ලට අනුව 2021.12.27 වන දින ඔහුව මහව නගරයේදී අත්අඩංගුවට ගෙන ඇත්තේ මවට බෙහෙත් බඩු ලබා ගැනීම සඳහා ගොස් සිටියදී ය. පැමිණිලිකරුගේ මව විසින් 2022.01.18 දිනැතිව දිවුරුම් ප්‍රකාශයක් ලබාදෙමින් ප්‍රකාශ කර සිටින්නේ ද ඇයට බෙහෙත් බඩු ලබා ගැනිම සඳහා මහව නගරයට පුතා සමග ගොස් සිටියදී තමා ඉදිරියේ තම පුතා වන පැමිණිලිකරු අත්අඩංගුවටගත් බවත්, පොලිස් නිලධාරීන් දෙදෙනෙකු විසින් තම පුතාගේ හිසට පහර දෙමින් පොලිස් ස්ථානය තුළට රැගෙන ගිය බවත්, පෙලිස් ස්ථානය තුළදී එම නිලධාරීන් දෙදෙනා විසින් තම පුතාගේ හිසට සහ පිටට පහරදෙනු තමා දුටු බවත් ය. පසුව පෙලිස් ස්ථානයේ තිබූ කාමරයක් තුළට තම පුතාව දමා දොර වැසූ බවත්, එම කාමරය තුළදී තම පුතාට පොලිස් නිලධාරීන් පහරදෙන ශබ්දයත්, පුතා විලාප නගන ශබ්දයත් තමාට ඇසුණු බවත් පැමිණිලිකරුගේ මව විසින් සිය දිවුරුම් ප්‍රකාශය මගින් දක්වා ඇත.

පැමිණිලිකරු හා ඔහුගේ මව විසින් සිදු කරනු ලබන පහරදීමේ චෝදනාව වගඋත්තරකරුවන් විසින් ප්‍රතික්ෂේප කරන අතර 2023.02.13 වන දින කොමිෂන් සභාව හමුවේ පැවති පරීක්ෂණයේදී වගඋත්තරකරුවන් ප්‍රකාශ කර ඇත්තේ පැමිණිලිකරු හට කිසිදු පහරදිමක් සිදුනොකළ බවයි.

2021.04.27 වන දින මහව මූලස්ථාන පොලිස් ස්ථානයේ බල අපරාධ තොරතුරු සටහන් පොතේ පිටුව 100 සහ ඡේදය 280 යටතේ ඇතුළත්ව ඇති 1 වන වගඋත්තරකරු වන ප්‍ර. පො. ප. ජයන්ත රාජපක්ෂ මහතාගේ සටහනෙහි මෙම පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමට යාමේදී එයට විරෝධය පා

නිලධාරීන් සමග පොර බැදීම හේතුවෙන් ඔහුව මෙල්ල කරගැනීම සඳහා අත්විලංගු දමන ලද බව සඳහන් කර ඇත. පැමිණිලිකරු ඔවුන් සමග පොර බැදීම හේතුකොට ගෙන පැමිණිලිකරුට තුවාල සිදුවූ බවට එහි සඳහනක් නොමැත. 1 වන වගඋත්තරකරු වන ප්‍ර. පො. ප. ජයන්ත රාජපක්ෂ මහතා විසින් 2021.12.29 වන දින මහව මූලස්ථාන පොලිස් ස්ථානයේ බල අපරාධ තොරතුරු සටහන් පොතේ පිටුව 141 සහ ඡේදය 302 යටතේ යොදා ඇති සටහන අනුව පැමිණිලිකරුව අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී පිටතින් පෙනෙන තුවාල කිසිවක් ඔහුගේ ශරීරයේ නොපැවති බවද සටහන් කර ඇති බව නිරීක්ෂණය වේ.

පැමිණිලිකරු විසින් ඔහුට පහරදුන් බව පවසන වගඋත්තරකරුවන් දෙදෙනා විසින් පැමිණිලිකරුට පහරදීමක් සිදුනොකළ බව පමණක්ම ප්‍රකාශ කර ඇති අතර, චෝදනාව ප්‍රතික්ෂේප කිරීම සඳහා ප්‍රබල තර්කයක් ගොඩ නැගීම සිදුකර නැත.

<u>නිගමනය</u>

ඉහත දක්වන ලද සියලු කරුණු සමස්තයක් වශයෙන් ගෙන සලකා බැලීමේදී වගඋත්තරකාර පාර්ශවය විසින් සිය අනන්‍යතාවය එළිදරව් කිරීමට අකමැති වූ තොරතුරුකරුවෙකුගෙන් ලද එකම තොරතුරක් මත පදනම්ව පැමිණිලිකරු අත්අඩංගුවට ගෙන ඇති බවත්, එලෙස ලැබී ඇති තොරතුරෙහි විශ්වසනීය බව පිළිබඳව තහවුරු කර ගැනිම සඳහා තවදුරටත් විමර්ශන සිදුකර ඇති බවට 1 වන වගඋත්තරකරු විසින් ප්‍රකාශ කළ ද, එලෙස සිදු කරන ලද විමර්ශනයකදී අනාවරණය වූ කරුණු සම්බන්ධයෙන් කිසිදු සටහනක් යොදා නොමැති බවත් නිරීක්ෂණය වන බැවින්, නීතිය මගින් ප්‍රකාශිත නිසි කාර්ය පටිපාටිය අනුව අදාළ අත්අඩංගුවට ගැනීම සිදුව නොමැති බවට තහවුරු වේ. ඒ අනුව වගඋත්තරකාර පාර්ශවය විසින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 13(1) ව්‍යවස්ථාව මගින් සුරක්ෂිත කර ඇති පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම උල්ලංඝණය කර ඇති බව මෙයින් නිගමනය කරනු ලැබේ.

එසේම, පොලිස් ස්ථානය තුළට රැගෙන යන අතරතුරේදී සහ පොලිස් ස්ථානයෙහි ඇති කාමරයක් තුළ දී 2 වන සහ 3 වන වගඋත්තරකරුවන් විසින් තමාහට පහර දුන් බව පැමිණිලිකරු විසින් ප්‍රකාශ කර ඇත. එමෙන්ම, පැමිණිලිකරුගේ මව විසින් 2022.01.18 දිනැති දිවුරුම් ප්‍රකාශය මගින් ද එලෙස පොලිස් නිලධාරීන් දෙදෙනෙකු පැමිණිලිකරු වන තම පුතාගේ හිසට සහ පිටට පහරදෙනු තමා දුටු බවත්, පසුව පෙලිස් ස්ථානයේ තිබූ කාමරයක් තුළට තම පුතාව දමා දොර වැසූ බවත්, එම කාමරය තුළදී තම පුතාට පොලිස් නිලධාරීන් පහරදෙන ශබ්දයත්, පුතා විලාප නගන ශබ්දයත් තමාට ඇසුණු බවත් සඳහන් කර ඇත.

තවද, පැමිණිලිකරු සම්බන්ධයෙන් ඉදිරිපත්ව ඇති අධිකරණ වෛද්‍ය වාර්තාව තුළ ද පැමිණිලිකරුගේ දකුණු උරහිස පිටුපස සහ පපුවේ දකුණුපස පිටුපස සීරීම් තුවාල දෙකක් ඇති බවටත්, පපුවේ පිටුපස තැලීම් තුවාල හතරක් ඇති බවටත් වෛද්‍යවරිය විසින් සඳහන් කර තිබීම

තුළින්, පැමිණිලිකාර පාර්ශවය විසින් පහරදීම් සිදු කර ඇති බවට දක්වන ලද ස්ථානයන්හි අදාළ තුවාල ඇති බව නිරීක්ෂණය වන බැවින් පැමිණිලිකරු හට පොලිස් නිලධාරීන් විසින් පහර දී ඇති බවට සනාථ වේ. ඒ අනුව පැමිණිලිකරු පොලිස් අත්අඩංගුවේ සිටියදී ඔහු හට පොලිස් නිලධාරීන් විසින් පහරදීම් සිදු කර ඇති බව ඇසින් දුටු සාක්ෂි මගින් සහ අධිකරණ වෛද්‍ය වාර්තාව මගින් තහවුරු වන බැවින් එලෙස පහරදීම් සිදු කරන ලද බවට පැමිණිලිකරු විසින් හඳුනාගෙන ඇති 2 වන සහ 3 වන වගඋත්තරකරුවන් විසින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථාව මගින් සුරක්ෂිත කර ඇති කිසිම තැනැත්තෙකු වධ හිංසාවට හෝ කෲර අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුතු බවට වන පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම උල්ලංඝණය කර ඇති බව මෙයින් නිගමනය කරනු ලැබේ.

තවද, පොලිස් ආරක්ෂාව භාරයේ සිටියදී වගඋත්තරකාර පාර්ශවය විසින් පැමිණිලිකරු පහරදීමකට ලක්කර ඇති බවටත්, ඔහුට තුවාල සිදුකිරීමට මූලික වී කටයුතු කර ඇති බවටත් කරුණු තහවුරු වීම තුළින් පොලිස් දෙපාර්තමේන්තු නියෝග ඒ 20 හි සඳහන් පොලිස් ආරක්ෂාව භාරයේ සිටින තැනැත්තන් සම්බන්ධයෙන් පොලිස් නිලධාරීන් විසින් අනුගමනය කළ යුතු වන නියෝග නිසි පරිදි අනුගමනය කිරීමට වගඋත්තරකාර පාර්ශවය අපොහොසත් වී ඇති බව ද තහවුරු වේ. ඒ අනුව 1 වන, 2වන, 3 වන සහ 4 වන වගඋත්තරකරුවන් විසින් 1978 ආණ්ඩුකම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 12(1) වන ව්‍යවස්ථාව මගින් සුරක්ෂිත කොට ඇති නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීම ද නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුතු බවට වන පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම ද උල්ලංඝණය කර ඇති බව ද මෙයින් නිගමනය කරනු ලැබේ.

**ඒ අනුව පහත සඳහන් නිර්දේශ කර සිටී.**

1. 1 වන, 2 වන, 3 වන සහ 4 වන වගඋත්තරකරුවන් විසින් මෙම සිදුවීමේ දී ක්‍රියා කර ඇති ආකාරය සම්බන්ධයෙන් විනය පරීක්ෂණයක් පවත්වා ඔවුන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමට පොලිස්පතිවරයා විසින් පියවර ගත යුතු ය.

2. 2 වන සහ 3 වන වගඋත්තරකරුවන් විසින් එක් අයෙකුගෙන් රු.5,000/-ක මුදලක් බැගින් රු.10,000/-ක මුදලක් පැමිණිලිකරු වෙත වන්දි වශයෙන් ගෙවිය යුතු ය.

2024. 11 . 26 දිනට පෙර මෙකී නිර්දේශ ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම, එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත :- 01. අමාත්‍යතුමා,
මහජන ආරක්ෂක අමාත්‍යාංශය,
04 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල.

02. පොලිස්පති
ශ්‍රී ලංකා පොලීසිය
- අදාළ නිර්දේශය ක්‍රියාත්මක කිරීම සඳහා